GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

01/11/2013

## මාධ්‍ය නිවේදනය

**අද දින පැවැත්වෙන පරිපූරක වෛද්‍ය වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය සම්බන්ධව**

ඉහත වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය සම්බන්ධව මාධ්‍ය මගින් අනාවරණය වු කරුණු අනුව ඇති වු තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තිරණය කර ඇත.

2006 වසරේදී ඇති වු නව වැටුප් ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය සේවය ප්‍රධාන කාණ්ඩ 04ට බෙදා ඇති අතර ඒ ඒ කාණ්ඩවල ඇති සුදුසුකම් වගකීම් යන කාරණා මත පදනම්ව වැටුප් බලතල දීමනා සහ වරප්‍රසාධ තිරණය කර ඇත.

ඒ අනුව වෛද්‍යවරුන්ට ලැබෙන වැටුප් දීමනා සහ වරප්‍රසාධ ඔවුන්ගේ සේවයේ වගකීම් වලට ගැලපෙන ආකාරයෙන් ජාතික ප්‍රතිපත්තිය තුළ සකස් කර ඇත. නමුත් ජාතික ප්‍රතිපත්ති වලට පටහැනිව යමින් වෛද්‍යවරුන්ට හිමි දීමනා සහ වරප්‍රසාධ ඉල්ලා වෘත්තිය සංගම් ක්‍රියාමාර්ග වලට යැමෙන් දැඩි පරිශ්‍රමයෙන් ගොඩනගා ගත් ජාතික වැටුප් ප්‍රතිපත්තිය තර්ජනයට ලක් වනු ඇත.

යම් කිසි රාජ්‍ය සේවක කාණ්ඩයක් වෛද්‍යවරයෙකුට ලැබෙන වැටුප් සහ වරප්‍රසාධ අවශ්‍ය නම් කලයුතු වන්නේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ග වලට යැම නොව අදාල සුදුසුකම් සම්පූර්ණ කර වෛද්‍යවරයෙකු ලෙස රාජ්‍ය සේවයට එක්වීමයි.

ඒ අනුව පිළිගත් වැටුප් ප්‍රතිපත්තිවලට හා තම ශ්‍රේණියට අදාල ඉල්ලීම් දිනා ගැනීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංමයෙන් වැටුප් ප්‍රතිපත්ති වලට එකඟව විද්‍යාත්මක පදනමක සිට කටයුතු කිරීම තුලින් වෘත්තිය ගරුත්වය රැකෙන අතරම එය රාජ්‍ය සේවයේ දීර්ඝ කාලීන පැවැත්ම සඳහාද ඉවහල් වනු ඇත.

හුදු දේශපාලන ජනප්‍රියත්වය සඳහා කරනු ලබන වෘත්තිය සමිති ක්‍රියාමාර්ග වලින් වෛද්‍යවරුන්ට හිමි දීමනා ඉල්ලීමට යැමෙන් අවම වශයෙන් තම සේවයට අදාල ඉල්ලීම්වත් දිනා ගැනීමට නොහැකි වනු ඇති බව රජයේ වෛද්‍ය නිලධාරීනගේ සංගමයේ විශ්වාසයයි.

ස්තූතියි,

Fr
වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් ද සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516